*සැ. යු.-* 2018.09.14 දින පළ වූ අංක 2089 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,090 - 2018 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා - 2018.09.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2158 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2161 |


*සැ. යු.* -(i) ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ (සංශෝධන) පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ණය සහනදායක ආයතන (සංශෝධන) පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ඔක්තෝබර් මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 සැප්තැම්බර් මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ටවර් හෝල් රඟහල පදනම

ටවර් හෝල් රඟහල පදනමේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරු සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇති ස්ථිර තනතුරු වේ.

(අ) **කළමනාකාර සේවා ගණයේ තනතුරු** - MM 1-1

1. සහකාර අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන) (II ශ්‍රේණිය) තනතුර - තනතුරු 01

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නාට්‍ය හා රංගකලාව/ අධ්‍යාපන/ සෞන්දර්ය/ කලා/ ජනසන්නිවේදන විෂය සම්බන්ධයෙන් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ හෝ අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

**වෙනත් සුදුසුකම්**
පරිගණක භාවිතය සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩකිරීමේ හැකියාව තිබිය යුතුය.

දෙමළ භාෂිත නාට්‍ය, රචනය, නිෂ්පාදනය, රඟපෑම, විවිධ ප්‍රාසාංගික වැඩසටහන් සම්පාදනය හා මෙහෙයවීම. නාට්‍ය හා රංගකලාව හෝ අධ්‍යාපනවේදී විෂයයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම, සිංහල භාෂාව කථා කිරීමට හා ලිවීමට ඇති හැකියාව විශේෂ සුදුසුකමකි.

**වැටුප් පරිමාණය**

2018.01.01 දින සිට -MM 1-1 රු. 42,161 - 3 x 1091 - 13 x 1119 - 59,981
2020.01.01 දින සිට - MM 1-1 රු. 53,175 - 1375 x 10 - 1910 x 15 - 95,575

**රැකියා විස්තරය**
දෙමළ භාෂිත නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය, දෙමළ භාෂිත නාට්‍යවේදීන්ගේ සුභ සාධන අවශ්‍යතා ඉටු කරමින් ඔවුන් නාට්‍ය නිර්මාණ කාර්යයේ පෙළඹවීමට දිරිගැන්වීමට අදාළ කටයුතු කිරීම, දෙමළ මාධ්‍ය නාට්‍ය තරග වැඩමුළු සම්මන්ත්‍රණ සංවිධානය මගින් නාට්‍යවේදීන් දිරිගැන්වීම, දෙමළ මාධ්‍ය අන්තර් පාඨශාලයීය නාට්‍ය තරගාවලිය හා අන්තර් විශ්වවිද්‍යාලයීය නාට්‍ය තරග ගුරුවරුන් සඳහා වැඩමුළු සම්මන්ත්‍රණ සංවිධානය.

(ආ) **කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ තනතුරු** - JM 1-1

2. අභ්‍යන්තර විගණන නිලධාරි - තනතුරු 01
සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ව්‍යාපාර පරිපාලනය හෝ ගණකාධිකරණ විෂයට අදාළව උපාධියක් තිබීම ;

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වී තිබීම.

*වැටුප් පරිමාණය* :
2018.01.01 දින සිට -JM 1-1 රු. 33,770 - 15 x 599 - 42,755
2020.01.01 දින සිට - JM 1-1 රු. 42,600 - 755 x 10 - 1135 x 18 - 70,580

**රැකියා විස්තරය**
ආයතනයේ සියලු මූල්‍ය කටයුතුවලදී රාජ්‍ය මුදල් නිසිලෙස කළමණාකරණය වන්නේද යන්න විමර්ශනය කර බැලීම සහ ආයතන සංග්‍රහය. මුදල් රෙගුලාසි, පදනමේ අත්පොත සහ අදාළ වන්නාවූ රාජ්‍ය චක්‍රලේඛ සහ රෙගුලාසිවලට අමාත්‍යාංශ නියමයන්ට සහ භාරකාර මණ්ඩලයේ උපදෙස් අනුව කටයුතු කර ඇත්දැයි විමර්ශනය කර අධ්‍යක්ෂ ජනරාල් වරයාට වාර්තා කිරීම සහ අනුමැතිය ලැබෙන පරිදි අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ භාරකාර මණ්ඩලයට වාර්තා කිරීම හා නිවැරදි විගණනයක් තුළින් ආයතනයේ යහ කළමනාකරණය සඳහා සහාය වීම.

(ඇ) **ක්‍රියාත්මක කිරීමේ හා උපදේශන සේවා ගණයේ තනතුරු** - (MA - 4)

3. **ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලක - තනතුරු 01**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ශබ්ද තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

නාට්‍ය හා රංගකලා උපාධිය, ප්‍රාසාංගික කලා උපාධිය හෝ ජනසන්නිවේදන උපාධිය ලබා ශබ්ද පටිගත කිරීම පිළිබඳ වසරක පළපුරුද්ද;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විෂයයන් තුනකින් සාමාර්ථය සමඟ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ තාක්ෂණික උපකරණ භාවිත කරන ප්‍රමුඛ පෙළේ ශබ්දාගාරයක ශබ්ද ක්‍රියාකරුවෙකු ලෙස වසර 05ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :**

2018.01.01 දින සිට -MA - 4 රු. 30,074 - 15 x 599 - 39,059
2020.01.01 දින සිට - MA - 4 රු. 37,970 - 10 x 755 - 15 x 930 - 5 x 1135 - 65,145

**රැකියා විස්තරය :**

ටවර් ශබ්දාගාරයේ ශබ්ද පටිගත කිරීමේ උපකරණ සහ ශබ්දාගාරයේ සියලුම උපකරණ මනා ලෙස නඩත්තු කර පවත්වාගෙන යාම හා එහි කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීම, නියමිත ප්‍රමිතියෙන් සියලුම පටිගත කිරීම් සිදු කිරීම හා ඊට අනුශාංගික කටයුතු සිදු කිරීම.

(ඇ) **කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ තනතුරු**

4. **ශබ්ද පරිපාලක** (MA 2-1) - තනතුරු 01

**අධ්‍යාපන සුදුසුකම් :**

තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ ශබ්ද පරිපාලන කටයුතුවලට අදාළ තාක්ෂණික පාඨමාලාවක් හදාරා තිබීම ;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ, ගණිතය යන විෂයයන් ඇතුලුව විෂයයන් 4කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් සමත්ව රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ නව තාක්ෂණික ක්‍රම භාවිතා කරන ප්‍රමුඛ පෙළේ ශබ්දාගාරයක ශබ්ද පටිගත කිරීම පිළිබඳ වසර 03ක පළපුරුද්ද.

**වෙනත් සුදුසුකම්**

පරිගණක භාවිතය හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩකිරීමේ හැකියාව, නාට්‍ය හා රංග කලාව හෝ සංගීතය විෂයක් ලෙද හදාරා තිබීම දෙමළ භාෂාවෙන් වැඩ කිරීමට ඇති හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**රැකියා විස්තරය**

ටවර් ශබ්දාගාරයේ ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලක යටතේ ශබ්ද පටිගත කිරීමේ කටයුතුවලට සහායවීම, නිසි අවධානයෙන් සැලකිල්ලෙන් ආයතනයේ සේවා දායකයන්ට ආකර්ශනීය සේවා තත්වයක් ලබාදෙමින් නිසි ප්‍රමිතියකට පටිගත කිරීම හා ඊට අදාළ අනෙකුත් කටයුතු සිදු කිරීම.

5. වැඩමුලික **(සිවිල්)** (MA 2-1) - තනතුරු 01

**අධ්‍යාපන සුදුසුකම්**

තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ වැඩමූලික සිවිල් කටයුතුවලට අදාළ තාක්ෂණික පාඨමාලාවක් හදාරා තිබීම.

**වෙනත් සුදුසුකම්**

පරිගණක භාවිතය හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩකිරීමේ හැකියාව තිබීම හා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමට ඇති හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**රැකියා විස්තරය**

ප්‍රධාන කාර්යාලය සහ ශබ්දාගාරය ඇතුළු රංග ශාලාවන්හී ඉදිකිරීම්, විදුලිය, වායුසමනය, ජල සහ අපජල වහනය ඇතුළු වෙනත් තාක්ෂණික කටයුතු මෙන්ම නඩත්තු කටයුතු දෛනිකව සිදු කිරීම, ඒ පිළිබඳව නිර්දේශයන් ලබා දීම, නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු බාහිර ආයතන මඟින් සිදු කෙරෙන්නේ නම් ඒ පිළිබඳ පූර්ණ අධීක්ෂණය කිරීම.

6. **තාක්ෂණික සහකාර** (MA 2-1) - **තනතුරු 01**

**අධ්‍යාපන සුදුසුකම්**

තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ පරිගණක හා දෘඩාංග කටයුතුවලට අදාළ තාක්ෂණික පාඨමාලාවක් හදාරා තිබීම.

**වෙනත් සුදුසුකම්**

පරිගණක මෘදුකාංග හා දෘඩාංග කටයුතු පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම, නාට්‍ය හා රංග කලාව විෂයක් ලෙස හදාරා තිබීම, දෙමළ භාෂාවෙන් වැඩ කිරීමට ඇති හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**රැකියා විස්තරය**

ටවර් හෝල් රඟහල පදනමේ භාවිතයට යොදා ගන්නා පරිගණක, ඡායා පිටපත් හා ෆැක්ස් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර (Printers) ආදියේ නඩත්තු කටයුතු ඒ පිළිබඳ තාක්ෂණිකව කළ හැකි කළ යුතු අළුත්වැඩියාවන් ඉටු කිරීම, පරිගණක දෘඩාංග හා මෘදුකාංග අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු මැනවින් ඉටු කිරීම.

වැටුප් පරිමාණය :

2018.01.01 දින සිට -MA 2-1 රු. 24,030 - 15 x 238 - 28,314
2020.01.01 දින සිට - MA 2-1රු. 30,310 - 18 x 300 - 35,710

(ඉ) **ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු**

7. ශබ්ද ක්‍රියාකරු (PL -3) - තනතුරු 02
8. රංගාලෝක ශිල්පී (PL -3) - තනතුරු 02
9. නඩත්තුකරු (PL -3) - තනතුරු 02

**අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02)ක් සහිතව විෂයයන් හය (06)කින් සමත් වීම.

*ප්‍රවීණතා* :
තනතුරට අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ 04 වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

ශබ්ද ක්‍රියාකරු තනතුර සඳහා ඉහත සුදුසුකම්වලට අමතරව ශබ්ද ක්‍රියාකරුවකු ලෙස රාජ්‍ය හෝ පුද්ගලික ආයතනයක වසර දෙකක පළපුරුද්දක් තිබිය යුතුය.

වැටුප් පරිමාණය :
2018.01.01 දින සිට - PL 3 රු. 20,842 - 18 x 214 - රු. 24,694
2020.01.01 දින සිට - PL 3 රු. 26,290 - 270 x 18 - රු. 31,150

**රැකියා විස්තරය :**

*ශබ්ද ක්‍රියාකරු* :
රංග ශාලාවන්හී විද්‍යුත් තාක්ෂණ මෙවලම් මගින් කෙරෙන ශබ්ද පාලනයේදී එම මෙවලම් භාවිතා කරමින් ප්‍රේක්ෂකයන්ට ශ්‍රවණ අපහසුවක් නොවන පරිදි නිසි ප්‍රමිතියකින් ශබ්ද විකාශය කරමින් රංග ශාලාවල ශබ්ද උපකරණ හා මෙවලම් ක්‍රියාකරවීම.

*රංගාලෝක ශිල්පී* :
රංග ශාලාවේ ප්‍රදර්ශනය කෙරෙන රංගාලෝකය සැපයිය යුතු නාට්‍යයක් හෝ වෙනත් යම් ප්‍රසංගයක් සඳහා රංගාලෝක භාවිතයට පෙරාතුව ඒ සඳහා එම නාට්‍යයේ හෝ ප්‍රසංගයේ අධ්‍යක්ෂවරයා සමග එක්ව අවශ්‍ය රංගාලෝකය පිළිබඳව අවශ්‍ය කටයුතු නිසි සැලකිල්ලෙන් නිසි අවධානයෙන් සහ වගකීමකින් ඉටු කිරීම.

*නඩත්තුකරු* :
රංග ශාලාවන් ඇතුළු ටවර් හෝල් රඟහල පදනමට අයත් සියලු ආයතනවලට අදාළ ගොඩනැගිලි ජලනල, වායුසමීකරණ වැනි අංශවලට අදාළව එදිනෙද ඉටුකළ යුතු නඩත්තු කටයුතු නිසි සැලකිල්ලෙන් සහ අවධානයෙන් හා වගකීමකින් අප්‍රමාදව ඉටු කිරීම.

(ඊ) ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණියේ තනතුරු :

10. **රංගාලෝක ශිල්පී සහායක** (PL -2) - තනතුරු 03

රංගාලෝක ශිල්පී සහායක තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක රංගාලෝක ශිල්පය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය* :
2018.01.01 දින සිට -PL 2 රු. 20,414 - 18 x 214 - රු. 24,266
2020.01.01 දින සිට - PL 2 රු. 25,750 - 18 x 270 - රු. 30,610

රැකියා විස්තරය :
රංගාලෝක ශිල්පියාගේ උපදෙස් අනුව ඒ ඒ වේදිකා නාට්‍ය සඳහා අවශ්‍යවන්නා වූ රංගාලෝක මෙවලම් විධිමත්ව හා ආරක්ෂිතව ස්ථානගත කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හී වේදිකාව මත සිට රංගාලෝක ශිල්පියාට අවශ්‍ය සහාය දැක්වීම.

*වයස.*-අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

පොදු සුදුසුකම් :

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

උක්ත තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම සුදුසුකම් තහවුරු කෙරෙන සහතිකවල සහතික කළ පිටපත් සමඟ තම අයදුම්පත් 2018 ඔක්තෝබර් මස 12 වැනි දිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමා ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරනු ලබන අය තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතු අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරනු ලබන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ටවර් හෝල් රඟහල පදනම,

"සව්සිරිපාය", අංක 123, විජේරාම මාවත,
කොළඹ 07.

09-827

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිළධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2018 සැප්තැම්බර්

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් ස්ථිර කිරීමට පෙර හා මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරක නිලධාරියකු එකී පත්වීම් දින සිට දෙවසරක කාලයක් ඇතුළත සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2018.10.28 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාලසටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* :

අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තව ද, මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරින් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරින්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

03. *අයදුම්පත්* :

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත 2018.09.21 වැනි දින හෝ ඊට ප්‍රථම භාර දිය යුතු ය. සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ බවට ආයතන ප්‍රධානීන් විසින් සහතික කරන ලද අයදුම්පත් කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ''සුවසිරිපාය'' අධ්‍යක්ෂ (විභාග) වෙත 2018.09.28 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. තම අයදුම්පත සමඟ රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 45ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවර 2ක් ද එවිය යුතු ය. (මෙහි කැමති පරිදි ලිවිය හැකිය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිතවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ. *යු* : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඉ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඊ) සිට අංක 9 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

04. *විභාග ගාස්තු* :

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය.

(ii) කිසිඳු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත්කර ගැනීම* :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයින්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණකර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) ජාතික හැඳුනුම්පත;
(*ආ*) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන හැඳුනුම්පත්‍රය;
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය;
(*ඈ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරික්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකි ය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය හා විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිළධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක්ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකි ය. ප්‍රවේශ පත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතික කර රැගෙන පැමිණිය යුතු ය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.
(වෙබ් අඩවිය-www. health. gov.lk)

06. *විභාග පරිපාටිය* :
මෙම විභාගය ලිඛිත රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විත ය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත් වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගත යුතු ය. එක් වරකදී හෝ කිහිපවරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. නිළධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියලුම විෂයන්ට පෙනී සිටිය යුතු ය.

07. *විභාග විෂය නිර්දේශ මාලාව* :

07:1 ලිඛිත විභාගය

07:1:1 ආයතන සංග්‍රහය - ප්‍රශ්න පත්‍රය
කාලය පැය 02 යි. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂය නිර්දේශය :

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි,

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි,

(iii) ආයතන සංග්‍රහය :

I කොටස — VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII පරිච්ඡේදයන්,

II කොටස — XLVII සහ XLVIII යන පරිච්ඡේදයන්.

07:1:2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ප්‍රශ්න පත්‍රය :
කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂයය නිර්දේශය :
සෞඛ්‍ය සේවා සංග්‍රහය -

(i) රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
(ii) රසායනාගාර සේවා කළමණාකරනය
(iii) ඖෂධ කළමණාකරනය

07:1:3 ගිණුම් ප්‍රශ්න පත්‍රය :
කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂයය නිර්දේශය :

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි;
(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මූල්‍ය කොටස;
(iii) වෛද්‍ය නිලධාරීන් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මූල්‍ය රෙගුලාසි.

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | මු. රෙ. 1, 2, 78 |
| පරිච්ඡේද II | - | මු. රෙ 90, 91, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - | මු. රෙ 124, 125, 126, 127, 128, 131,133,134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155, 156, 189 |
| පරිච්ඡේද V | - | මු. රෙ 200, 201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - | මු. රෙ 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - | මු. රෙ 488, 493 |
| පරිච්ඡේද XIII | - | මු. රෙ 715, 716, 756, 757, 758 |

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

1 වැනි පරිච්ඡේදය - සියළුම වගන්ති.
2 වැනි පරිච්ඡේදය - 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
3 වැනි පරිච්ඡේදය - 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9

07:2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :

සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරීන්ට දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍ය නිලධාරීන්ට සිංහල මාධ්‍යයෙන් ද සන්නිවේදනය කිරීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10කි.

08. *විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම* :

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීම ද නොකළ යුතු ය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන් ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඩුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයෙහි නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

මෙම තොරතුරු www.health. gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

*සැ. යු.*- විභාග නිවේදනයේ සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනයන් අතර යම් අනනුකූලතාවයන් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

බී. ජී. එස්. ගුණතිලක,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2018 සැප්තැම්බර් මස 03 වැනි දින,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය''
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2018 සැප්තැම්බර්**

01 (*අ*) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(*ආ*) (i) නිළ නාමය (අදාළ කොටුව තුළ ( ✓ ) ලකුණ යොදන්න.

I වෛද්‍ය නිලධාරි II දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට / II ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ ( ✓ ) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ආයතන සංග්‍රහය ගිණුම්

සිංහල වාචික දෙමළ වාචික

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුවේ ( ✓ ) හරි ලකුණ යොදන්න.) :

සිංහල ඉංග්‍රීසි දෙමළ

04. (*අ*) (i) දැනට සේවය කරන ආයතනය (පැහැදිලිව සඳහන් කරන්න.) :————.

(ii) මෙම ආයතනය අයත් වන්නේ -

රේඛීය අමාත්‍යාංශයට

පළාත් සභාවට

(*ආ*) (i) පළාත් සභාවට නම් අදාළ පළාත :————.

(ii) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඈ) ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

(ඉ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ ( ✓ ) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම් කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | හම්බන්තොට | | අම්පාර | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | | වව්නියා | |
| කුරුණෑගල | | අනුරාධපුර | | රත්නපුර | | පොළොන්නරුව | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | | ත්‍රිකුණාමලය | |

(ඊ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 45 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :————.

(උ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) :————.
(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :————.
(ආ) විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේ ද? :————.

| මුද්දර කොටුව (මුද්දර අලවා ඒ මත අත්සන තබන්න.) |
|---|

06. *අයදුම්කරුගේ සහතිකය* :

මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් ප්‍රථම වතාවට නොවන බැවින් රු.... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07. *පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ/නිලධාරිණියගේ සහතිකය :*

මෙම අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත් මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

—————,
නම සහ අත්සන.

දිනය :—————.

08. *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවට ද රු.................. ක් වටිනා මුද්දර මෙම මුද්දර අයදුම් පත්‍රයට අලවා ඇති බව ද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද මා ඉදිරිපිටදී අත්සන් කළ බව ද සහතික කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය)

දිනය :—————.

09. *විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය :*

........................... මහතා/මහත්මිය/මෙනවිය වෛද්‍ය නිලධාරියකු/ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

—————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :—————.

(අනවශ්‍ය කොටස් කපා හරින්න)

09-606

---

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ සැලසුම් ශිල්පී (සිවිල්/ සංඥ/යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණියෙහි පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.(ඒ අනුව 2000.10.19 දිනට හෝ ඊට පෙර හා 1988.10.19 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018.10.19 වේ. සියලුම අයදුම්පත් එදිනට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කිසිම අයදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ නොකළ යුතුය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවන් තම අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් නියමිත දිනට පෙර එවිය යුතුය. මෙම තරග විභාගය 2019 ජනවාරි මස පැවැත්වීමට නියමිතය.

01. *අයදුම්පත් කැඳවනු ලබන තනතුර* : සැලසුම් ශිල්පී (සිවිල්/ සංඥා/ යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණිය.

02. *තනතුරේ රාජකාරී ස්වභාවය* :
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් සැලසුම් ශිල්පී (සිවිල්), සැලසුම් ශිල්පී (සංඥා), සැලසුම් ශිල්පී (යාන්ත්‍රික) යන තනතුරු වලට වෙන් වශයෙන් පවරා ඇති රාජකාරී ලැයිස්තුවට අනුව රාජකාරී කටයුතු ඉටු කරනු ලබයි.

03. *වැටුප් පරිමාණය* :
* පුහුණු කිරීමේ ශ්‍රේණියට අදාළ දීමනාවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V පරිදි 2018.01.01 දින සිට රු. 21,532.00 ක මාසික දීමනාවක් හා රු. 4,306.00 ක ගැලපුම් දීමනාවක් ගෙවනු ලැබේ.

සැලසුම් ශිල්පී (සිවිල්), සැලසුම් ශිල්පී (සංඥා), සැලසුම් ශිල්පී (යාන්ත්‍රික)111 පෙළ සඳහා අදාළ වන වැටුප් පරිමාණය
MN - 03 - 2016
රු. 31,040 - 10x455 - 11x660 - 10x730 - 10x750 - රු. 57,550/-
(2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වැටුප් ගෙවනු ලබන්නේ රා.ප.ච. 03/2016 හි උපලේඛන 11 හි සඳහන් පරිදි වේ.)

04. (අ) *අධ්‍යාපන සුදුසුකම්* :
(i) (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් හයකින් (06) එකවර අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම ;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේ දී සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව ඇතුළු භෞතික විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම ;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඉංජිනේරු තාක්ෂණවේදය ඇතුළු තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

(ඇ) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඈ) වෙනත් සුදුසුකම් :
i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය
iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

iv. සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාග යට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික වල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :
ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

06. *බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පරිපාටිය* :

(i) විභාග ක්‍රමය
(අ) විභාග සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පැවැත්වේ.
(ආ) සියලුම ප්‍රශ්න පත්‍ර වලට පෙනී සිටිය යුත්තේ ඉහත (04) යටතේ සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) විභාගයේ විෂයයන් :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | කාලය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | පැය 01 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | පැය 03 | 40% |

විෂය නිර්දේශය :

| විෂයයන් | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, සිද්ධි විශ්ලේෂණය කිරීමේ හැකියාවත්, තීරණ ගැනීමේ හැකියාවත් පරීක්ෂා කෙරේ. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඇඳීමේ මූලධර්ම සම්බන්ධ දැනුම පරීක්ෂා කෙරේ. |

ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය :

i. බුද්ධි පරීක්ෂණය - ප්‍රශ්න 40 කින් සමන්විත බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

ii. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :

1 කොටස - ඇඳීමේ මූලධර්ම සම්බන්ධ අනිවාර්ය ප්‍රශ්න 01

2 කොටස - ඇඳීමේ මූලධර්ම, උපකරණ භාවිතය, මිනුම් ඒකක, ගණිතය, මූලද්‍රව්‍ය ඇතුළු විෂයානුබද්ධ ප්‍රශ්න 06 කින් 04 කට පිළිතුරු සැපයීම (සියලුම ප්‍රශ්න වලට එම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතු යි.)

07. අයදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස් :

i. අයදුම්පත A 4 (යතුරු ලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසි වල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු ය. අයදුම්පතේ අංක 01 සිට 06 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය 2 හා 3 පිටුවලට ද ඇතුළත් වන පරිදි අයදුම්පත සකස්කළ යුතු අතර එම විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

අයදුම්පත පිළියෙල කර ගන්නා විට අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත් වල සිංහලයට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත් වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

ii. අදාළ විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600/- කි. එය විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇමිණිය යුතුය. මෙම ලදුපතෙහි ඡායා පිටපත් ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයකට මුදල් ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත්කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන්න. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පී (සිවිල්/ සංඥා/ යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 " ලෙස සඳහන් කරන්න.

iv. බාහිර අයදුම්කරුවන්ගේ අයදුම්පත් වල අත්සන සහතික කිරීම.

"රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිළධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිළධාරියෙකු, රු.240,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.''

v. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. මොවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවීම අනිවාර්ය වේ.

vi. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් එවනු ලැබේ. තරග

විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

vii. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත.

viii. නිවේදනය පළවී දින 2 ක් 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැනුවීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පතෙහි පිටපත ද, ගෙවන ලද විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත ද, ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, අයදුම් කරන ලද විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය ද සඳහන් කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර සමග විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

ix. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණි. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේදී ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

x. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

xi. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදු වේ.

xii. *විභාග ප්‍රතිඵල*.-ගැසට් නිවේදනයේ 06 - V ඡේදය අනුව ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරි වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම සිදු කරනු ඇත.

08. *සේවා කොන්දේසි* :

සැලසුම් ශිල්පී (සිවිල්) / සැලසුම් ශිල්පී (සංඥා) / සැලසුම් ශිල්පී (යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු එක් අවුරුදු පුහුණු කාල සීමාවකට යටත් කරනු ලබන අතර පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා වන දීමනාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V පරිදි වේ. පුහුණුව අවසානයේ දී පුහුණු අවසන් පරීක්ෂණයක් පැවැත්වෙන අතර ඉන් සමත් වන්නන් අදාළ තනතුරේ 111 ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තබනු ලැබේ.

09. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තව දුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. රාජ්‍ය සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ මට්ටමේ ප්‍රවීනතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා අනුෂාංගික චක්‍රලේඛ අනුව ලබා ගත යුතුයි.

iii. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන වලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිකුත් කර ඇති ආයතන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝගයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

10. i. මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (MN-03)- තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සියලුම විධිවිධාන අදාළ වන බව දැනුම් දෙමි.

ii. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරි සතු වේ.

iii. මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්තේ නම් එවැනි විටකදී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි බව සලකා කටයුතු කළ යුතුය.

එම්. ජේ. ඩී. ප්‍රනාන්දු,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

## Open Competitive Examination for Recruitment to the Supervisory Management Assistant - Technical Service of Sri Lanka Railway Department - 2018

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

විභාගය සඳහා ඉල්ලුම්කරන තනතුර
සැලසුම් ශිල්පී (සිවිල්) - 1
සැලසුම් ශිල්පී (සංඥ) - 2
සැලසුම් ශිල්පී (යාන්ත්‍රික) - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
[ ] ඉල්ලුම්කළ හැක්කේ එක් තනතුරක් සඳහා පමණි.

විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
[ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරවැසිභාවය :
පරම්පරාවෙන් - 1
ලියාපදිංචි වීමෙන් - 2
[ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. සම්පූර්ණ නම :
i. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
ii. සිංහලෙන් / දෙමළෙන් :————.

02. අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
i. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. GUNAWARDHANA, H. M. S. K.)
ii. සිංහලෙන් / දෙමළෙන් :————.

03. ස්ථිර ලිපිනය :
i. සිංහලෙන් / දෙමළෙන් :————.
ii. ඉංග්‍රීසියෙන් :————.

04. දුරකතන අංකය :————.

05. ස්ත්‍රී / පුරුෂ භාවය :
ස්ත්‍රී 1
පුරුෂ 0
[ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | | ]

07. ජන වර්ගය :

සිංහල - 1 / ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2 / ඉන්දියානු ද්‍රවිඩ - 3
මුස්ලිම් - 4 / බර්ගර් - 5 / මැලේ - 6
[ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. පදිංචිය :
i. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————. එහි අංකය :————.
ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
iii. දිස්ත්‍රික්කය :————.

09. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

2018.10.19 දිනට වයස : අවුරුදු : ☐☐ මාසඃ ☐☐ දිනඃ ☐☐

10. අධ්‍යාපන සුදුසුකම් :

i. අ.පො.ස. (සා.පෙළ)
විභාග අංකය :————. වර්ෂය :————.

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| i. | | |
| ii. | | |
| iii. | | |
| iv. | | |
| v. | | |
| vi. | | |
| vii | | |
| viii | | |
| ix | | |

ii. අ.පො.ස. (උ.පෙළ)
විභාග අංකය : වර්ෂය :————.

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| i. | | |
| ii. | | |
| iii. | | |
| iv. | | |

iii. වෘත්තීය සුදුසුකම් :

……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුව තුළ "X"ලකුණ යොදන්න )

ඔව් ☐ නැත ☐

12. *අයදුම්කරුගේ සහතිකය :*

(*අ*) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සහ / හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(*ආ*) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව හා මා තනතුරට පත්වීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(*ඇ*) තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(*ඈ*) ............................. දින ............................................ තැපැල් කාර්යාලයට රු. 600 ක් ගෙවා ලබාගත් අංක ........................... දරන ලදුපත මේ සමග අමුණා ඇත.

| |
|---|
| ලදුපත එහි එක් දාරයක් මගින් නොගැලවෙන සේ අලවන්න.<br>(ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*13. අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................ මහතා / මහත්මිය / මෙනවිය මම පුද්ගලිකව හඳුනමි. ඔහු .................................. දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

14. *දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ................................... මහතා / මහත්මිය / මෙනවිය .................................. දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ................. දින සිට .............. දින දක්වා .......................... වශයෙන් සේවය කරන අතර ඔහුට / ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත./ඇත. ඔහුගේ/ ඇයගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ ඇය දුම්රිය දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පී (සිවිල්/ සංඥා/ යාන්ත්‍රික) පුහුණු ශ්‍රේණිය සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන් / ආයතනයෙන් මුදා හැරීමට හැකි/ නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

————————,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

09-599

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 2 සේවා ගණයේ (MN 05-2006 A) පෝෂණවේදී II ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා ආයතන සඳහා පෝෂණවේදී II ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. (බඳවා ගන්නා නිලධාරීන් සංඛ්‍යාව සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා අවශ්‍යතාව මත අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.)

02. *අවශ්‍ය සුදුසුකම් :*

I අධ්‍යාපන සුදුසුකම් :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආහාර විද්‍යාව හා පෝෂණවේදය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.

03. *කායික සුදුසුකම් :*
ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

04. *වෙනත් :*
(i) 2018.10.22 දිනට අයදුම්කරුවන් විසින් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
(ii) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
(iii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය. I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත් විය යුතුයි.

(iii) 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත තනතුරට බැඳුනු භාෂාවට අතිරේක අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

06. *වයස් සීමාව* : ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

07. *වැටුප්* : 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි දැක්වෙන MN-05-2016-ඒ 2 වැටුප් ඛණ්ඩයට මෙම තනතුර අදාළ වේ.

- *වැටුප් පරිමාණය* : රු. 34,605-10x660-11x755-15x930-රු. 63,460 වන අතර වැටුප ඔබට හිමි වන්නේ 2020.01.01 වැනි දින සිට වේ. එම චක්‍රලේඛයේ II උපලේඛනය අනුව වැටුප් ගෙවනු ලැබේ. (පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට අදළ වැටුප් ගෙවනු ලැබේ.)

08. ලිඛිත පරීක්ෂණය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ. :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ පරීක්ෂණය | පැය 01 | 100% | 40% | ඒ ඒ තනතුරට අදළව ක්ෂේත්‍රගත සාමාන්‍ය විෂය කරුණු සහ ප්‍රයෝගික යෙදීම් යන කරුණු සම්බන්ධය හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ. |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |

09. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :

ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. (*අ*) අයදුම්පත්‍ර 2018.10.22 වැනි දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ (පාලන) 07,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
සුවසිරිපාය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(*ආ*) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන විට අපේක්ෂකයින් සියලු සුදුසුකම් සහ අවශ්‍යතා සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

(*ඇ*) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 07 දක්වාත් දෙවන පිටුව අංක 08 සිට 10 දක්වාත් දැක්වෙන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කල යුතුය.

(ඇ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ ''පෝෂණවේදී තනතුර (විවෘත) බඳවා ගැනීම් සඳහා අයදුම්පත්‍රය'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඉ) මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු කටයුතු විද්‍යුත් තැපැල මගින් සිදු කිරීමට ද ඉඩ ඇත. එමනිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල ලිපිනයක් ලබාදීම අනිවාර්ය වන අතර ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

(ඊ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු අතර හෝ රු. 334,452 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(උ) විභාග ගාස්තු : විභාග ගාස්තුව රු. 500 කි. ලංකා බැංකුවේ තැපොබේන් ශාඛාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි ඇති කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

(ඌ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන ආයතනයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(එ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබදු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

- මෙම ගැසට් නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් මතුවන ගැටළු සඳහා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

බී. ජී. එස්. ගුණතිලක,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පෝෂණවේදී තනතුර සඳහා (විවෘත) බඳවා ගැනීම**

පදිංචි දිස්ත්‍රික්කය :- [ ]

විභාගය සඳහා ඉදිරිපත්වන මාධ්‍ය :- [ ]
(සිංහල -S, ඉංග්‍රීසි - E, දෙමළ - T)

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා.- SILVA A. B.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ලිපිනය (පෞද්ගලික) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
2.2 ලිපිනය (පෞද්ගලික) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ලිපිනය (රාජකාරි) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
(ලිපිනයෙහි වෙනසක් වේනම් එය වහාම දැන්විය යුතුය.)
2.4 දුරකථන අංකය (පෞද්ගලික) :————.
2.5 ඊ-මේල් ලිපිනය :————.

03. උපන් දිනය ඃ

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| ☐☐☐☐ | ☐☐ | ☐☐ |

3.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ- අවු. :————. මාස :————. දින :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

06. සුදුසුකම් (නිවේදනයේ 2 ඡේදයට යටත් වන සුදුසුකම්)
අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :————.
පළපුරුද්ද :————.

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

7.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
7.2 ලදුපත් අංකය හා දිනය :————.
7.3 ගෙවූ මුදල :————.

| ලංකා බැංකු ශාඛාවකට රු. 500.00 ක මුදල ගෙවා ලබාගත් රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

08. *අයදුම්කරුගේ සහතිකය ඃ*

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම් විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයාගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම් කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බව ද පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය)

10. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු වන ............................ මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ ........................ වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බවත්, ........................ දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළබවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය.)

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක III ශ්‍රේණිය (සිවිල්/විදුලි/යාන්ත්‍රික)

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රාජකාරි කටයුතු සිදුකරන වැඩබිම් දිවයින පුරා විසිරී ඇති අතර, පහත දැක්වෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

| *දිස්ත්‍රික්කය* | *තාක්ෂණ සහායක III ශ්‍රේණිය පුරප්පාඩු ප්‍රමාණය* |
|---|---|
| බදුල්ල | 1 |
| මොණරාගල | 1 |
| ත්‍රිකුණාමලය | 1 |
| පොළොන්නරුව | 1 |
| කුරුණෑගල | 1 |
| අනුරාධපුරය | 1 |
| මාතලේ | 1 |
| පුත්තලම | 1 |
| කොළඹ | 6 |
| රත්නපුර | 2 |
| ගාල්ල | 1 |
| හම්බන්තොට | 1 |
| මාතර | 1 |

2.0 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ4 කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් 2018.10.21 වැනි දිනට හෝ එදිනට ප්‍රථම "**ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, 2 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "**ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය**"යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

3.1 මෙම තනතුර ස්ථිර ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

3.2 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති ද කාර්ය පටිපාටික රීති ද අදාළ වේ.

3.3 තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, කලින් කල රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතුය.

4.0 **සාමාන්‍ය සුදුසුකම් :**

4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

4.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

4.3 බඳවා ගන්නා නිලධාරීන් දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට කැමති විය යුතුය.

4.4 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය.

5.0 **අවශ්‍යය අධ්‍යාපන සුදුසුකම් :**

5.1 භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය හා විද්‍යාව ඇතුළුව විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම.

6.0 **වෘත්තීය සුදුසුකම් :**

6.1 කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක III ශ්‍රේණිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ රජයේ තාක්ෂණ/ කාර්මික විද්‍යාලයකින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ (සිවිල්/විදුලි/යාන්ත්‍රික) සහතිකය ලබා තිබීම.

7.0 **තෝරා ගැනීමේ පදනම :**

7.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි :

මේ සඳහා වන ලිඛිත විභාගය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් CHPB ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මගින් පවත්වනු ලබනු අතර, ඔහු විසින් දැනුම් දෙනු ලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඔහු විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු වේ.

7.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට යොමුකරන අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

එම විභාගයේ ලකුණු ලබාගත් අනු පිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් එම ලකුණු අනු පිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණයේදී ලකුණු ලබා දෙනු නොලබන අතර සුදුසුකම් පමණක් පරීක්‍ෂාකරනු ලැබේ.

7.3 ලිඛිත තරග විභාගයට අදාල විස්තර පහත පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| තාක්ෂණික හැකියාව | පැය 03 | 100 | 40 |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය. |
| 02. තාක්ෂණික හැකියාව | *සිවිල්*<br>සැළසුම් පිළිබඳ දැනුම, අත්තිවාරම්, පස් වර්ග, ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි ව්‍යුහය සහ නිමාව, ගොඩනැගිලි සැළසුම් මගින් ප්‍රමාණ ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජල සැපයුම් හා පල්දෝරු ක්‍රම.<br>*විදුලි*<br>ගොඩනැගිලිවල විද්‍යුත් පරිපථ පිළිබඳ දැනුම, අනුගමනය කළයුතු රෙගුලාසි, සැළසුම් පිළිබඳ දැනුම, ඇස්තමේන්තු සැකසීම හා පරිපථවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම.<br>*යාන්ත්‍රික*<br>වාහන වර්ගීකරණය, අලුත්වැඩියාවේදී හා සේවා කිරීම්වල දී භාවිතා වන ආයුධ, එන්ජිමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම හා එහි එක් එක් කොටසෙහි කාර්ය භාරය, සිසිලන පද්ධතිය පිළිබඳ හා එහි එක් එක් කොටසෙහි කාර්ය භාරය පිළිබඳ දැනුම, ගොඩනැගිලි සඳහා භාවිතා කරන වායු සමීකරණ යන්ත්‍ර වර්ගීකරණය පිළිබඳ, කාර්යාල උපකරණ වර්ගීකරණය පිළිබඳ දැනුම. |

7.4 ලිඛිත තරග විභාගය සිංහල /දෙමළ භාෂාවෙන් පවත්වනු ලැබේ.

8.0 බඳවා ගැනීම:

ඉහත 5.0සහ 6.0 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති ලිඛිත විභාගය සමත් ඉහත 7.0 අනුව පුරප්පාඩු ප්‍රමාණය මත ඉහලම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

9.0 වැටුප් පරිමාණය:

කළමනාකරණ සහකාර - තාක්‍ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්‍ෂණ සහායක III ශ්‍රේණිය(සිවිල්/විදුලි/යාන්ත්‍රික)

රු. 29,840-10x300 -11x350 - 10x560 - 10x660- 48,890/-
(වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන 11 අනුවය)

10.0 විභාග ගාස්තු :
විභාග ගාස්තුව රු.1,000 කි. අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු.1,000ක විභාග ගාස්තුවක් ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම ලංකා බැංකුවක් මගින් "ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බත්තරමුල්ල ලංකා බැංකු ගිණුම් අංක 7042710 දරන ගිණුම"වෙත ගෙවිය යුතු අතර, එම ගෙවීමට අදාලව ලබා දෙන රිසිට්පත විභාග අයදුම්පතේ අංක 12 යටතේ ඇලවිය යුතුය.

11.0 යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමෙන්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

12.0 අත්සන සහතික කිරීම :

අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන, රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.240,360 හෝ ඊට වැඩි හෝ වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය තත්ත්වයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයින් සිය අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වේ.

එම්.එච්.එම්. ඉස්මයිල්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
2018 සැප්තැම්බර් මස 10 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක III ශ්‍රේණිය***

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අදාල කොටුවෙහි ✓ ලකුණ යොදා සලකුණු කරන්න.)

| | |
|---|---|
| සිවිල් | |
| විදුලි | |
| යාන්ත්‍රික | |

01. (i) සම්පූර්ණ නම :————.
(ii) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.) ':————.

02. ලිපිනය හා දුරකථන අංක :

(i) කාර්යාලයීය ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.
(iii) දුරකථන අංකය :————. (iv) ජංගම දුරකථන අංකය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

05. (i) උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

06. විවාහක/අවිවාහක බව :

අවිවාහක - 1
විවාහක - 2 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

07. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවර) (කරුණාකර පිටපත් අමුණන්න.):

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| .............................. | ............ | ........................... | ............ |
| .............................. | ............ | ........................... | ............ |
| .............................. | ............ | ........................... | ............ |
| .............................. | ............ | ........................... | ............ |
| .............................. | ............ | ........................... | ............ |

08. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවැනි වර) අවශ්‍යනම් පමණක් (කරුණාකර පිටපත් අමුණන්න.) :

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| .............................. | ............ | ........................... | ............ |
| .............................. | ............ | ........................... | ............ |
| .............................. | ............ | ........................... | ............ |

09. අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.):

විභාගය සමත් වූ වර්ෂය :————. මාසය :————. දිනය :————.

අයදුම්කරුගේ විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| .............................. | ............ | ........................... | ............ |
| .............................. | ............ | ........................... | ............ |

10. අනෙකුත් සුදුසුකම් : තාක්‍ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.) :————.

11. අදාළ ක්‍ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද :————.

ඉහත 10, 11 සඳහා සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්‍ය්‍ය බව සලකන්න.

12. විභාග ගාස්තු :

| |
|---|
| රු.1,000ක් වන විභාග ගාස්තු ගෙවන ලද රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න. **(රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)** |

13. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ..................................................................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන් බවත්, ................................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මෙයින් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

14. අයදුම්කරුගේ ප්‍රකාශයඃ

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. තව ද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත් එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ලක්වන බව ද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි**

මෙම ඉල්ලුම්කරු වන ..................................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............................................................................. වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

තනතුර :————.
දිනය :————.

————,
(නිල මුද්‍රාව)

09-668

## සංශෝධනයයි

### අධ්‍යාපන අමාත්‍යාංශය

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල ආගමික විෂයයන් ඉගැන්වීම සඳහා පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට
ධර්මාචාර්ය සමතුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

2018.08.31 වැනි දින පළ කරන ලද අංක 2,087 දරන *ගැසට් පත්‍රයේ* 08-1136 යන නිවේදනයෙහි අයදුම්පත් කැඳවන අවසාන දිනය 2018.10.31 දක්වා දීර්ඝ කරමි.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 සැප්තැම්බර් මස 14 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය, ''ඉසුරුපාය'',
පැලවත්ත, බත්තරමුල්ල.

09-899

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.